ජනාධිපති කාර්යාලය
ஜனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

වක්‍රලේඛ අංකය -PS/DSP/ENV/C/15/2019

2019 මැයි මස 13 වන දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියළුම ප්‍රධාන ලේකම්වරුන්
සියළුම රාජ්‍ය ලේකම්වරුන්
සියළුම පළාත් ලේකම්වරුන්
සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්
සියළුම රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**ජාතික පරිසර සැමරුම් සතිය - 2019 මැයි 30 සිට ජූනි 05**

ජීවයේ සම්භවය ඇති වූ දා පටන්ම සොබාදහම හා මිනිසා අතර වෙන් කළ නොහැකි සමීප සබඳතාවන් පැවතිය ද පසුකාලීනව අසීමිත මිනිස් අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම සඳහා සිදු කළ අයහපත් මානව ක්‍රියාකාරකම් හේතුවෙන් උද්ගත වූ පාරිසරික ගැටළු සමස්ත ජීවීන්ගේ පැවැත්මට විශාල තර්ජනයක් වී ඇත. සීඝ්‍ර ජනගහන වර්ධනයට සමගාමීව ඉස්මතු වූ මිනිස් අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් සීමිත සම්පත් අවිධිමත් ලෙස පරිහරණය කිරීම තුළින් ගෝලීය උෂ්ණත්වය ඉහළයාම, දේශගුණ විපර්යාස, පාංශු හායනය, ජල මූලාශ්‍ර සිඳීයාම ආදී පාරිසරික ගැටළු රැසක් උද්ගත වී ඇත. තවද, සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීමේ හුදු අභිප්‍රායන් මත අවිධිමත් සංවර්ධන උපාය මාර්ග අනුගමනය කිරීම තුළින් හා මිනිස් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සම්පත් අනිසි ලෙස පරිහරණය හේතුවෙන් සිදු වූ පාරිසරික අසමතුලිතතාවයන් මෙන්ම කාර්මික හා තාක්ෂණික විප්ලවයේ අනිටු ප්‍රතිවිපාක මෙම තත්ත්වයන් තවදුරටත් තීව්‍ර කිරීමට හේතු විය. මෙම අසමතුලිතතාවයන් මිනිසා ඇතුළු අනෙකුත් ජීවීන්ගේ පැවැත්මට විශාල තර්ජනයක් වී ඇති බැවින් පරිසර සංරක්ෂණයේ ඇති වැදගත්කම හා තිරසර සංවර්ධනය පිළිබඳව මේ වන විට ලොව පුරා වෙසෙන ජනතාවගේ දැඩි අවධානය යොමු වී ඇත.

02. එබැවින්, පරිසර සංරක්ෂණය පිළිබඳව ලෝක ප්‍රජාවගේ අවධානය යොමු කිරීමේ අරමුණින් 1972 වර්ෂයේ ස්වීඩනයේ ස්ටොක්හෝම් නුවර පැවති පරිසර සමුළුවේදී ගන්නා ලද තීරණයකට අනුව, **එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (UNEP)** බිහි වූ අතර එහි සමාරම්භක දිනය සැමරීම උදෙසා, සැම වසරකම **ජූනි 05 ජගත් පරිසර දිනය** ලෙස නම් කර ඇත. ඒ අනුව, පාරිසරික ගැටළු පිළිබඳව ලෝකවාසී ජනතාවගේ හා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමු කරවීම අරමුණු කර ගනිමින් එක් එක් වර්ෂයන්හිදී විශේෂිත තේමාවන් යටතේ සියලු රටවල වෙසෙන ජනතාව ජගත් පරිසර දිනය සමරනු ලබයි.

03.සත්ත්ව, ශාක ප්‍රජාවට හා මිනිසාගේ සෞඛ්‍යයට හානිකර අයුරින් මෙන්ම පරිසරයට අහිතකර බලපෑම් ඇති කරමින් සොබාදහමේ ක්‍රියාකාරීත්වයට අනර්ථකාරී ද්‍රව්‍ය සහ ශක්තීන් මුදා හැරීම හේතුවෙන් වාතයේ ගුණාත්මක තත්ත්වය පිරිහී යාම "වායු දූෂණය" වන අතර වායු දූෂණය මිනිසාගේ සෞඛ්‍යයට ප්‍රබල තර්ජනයක් එල්ල කර ඇති බව වර්තමානයේදී මුළු ලෝකයම පිළිගනු ලබයි. මුල් කාලවකවානුවන්හිදී වායු දූෂණය හේතුවෙන් පෙනහලු හා හෘදය ආශ්‍රිත රෝග වැළඳුණ බවට වාර්තා වූ නමුත්, වර්තමානයේදී දියවැඩියාව, ඩිමෙන්ෂියාව වැනි රෝග තත්ත්වයන් හා බුද්ධි මට්ටම පහළ යාම වැනි සෞඛ්‍යය ගැටළු ඇතිවීම සඳහා වායු දූෂණය සෘජු වශයෙන් බලපාන බව සොයා ගෙන ඇත. එබැවින්, වායුව දූෂණය අවම කර ගැනීම සඳහා පියවර ගැනීම අප සැමගේ වගකීමකි.

ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones ++ 94 (0) 11 2354418 ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax ++ 94 11 2446657
ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail prsec@presidentsoffice.lk

04. ඉහතින් සඳහන් කරනු ලැබූ කරුණු හේතුවෙන් මේ වන විට ලෝක ජනගහනයෙන් පුද්ගලයන් දහ දෙනෙකු අතරින් නව දෙනෙකුම ජීවත් වනුයේ, ජීවත් වීමට සුදුසු වාතාශ්‍රයකින් යුතු පරිසරයක නොවන බව සොයාගෙන ඇති අතර, නවතම සොයාගැනීම් අනුව අපිරිසිදු වාතය ආශ්‍රහණය හේතුවෙන් ලොවපුරා වසරකට මිය යන පිරිස මිලියන 07කට ආසන්න බව ද ඇස්තමේන්තු කර ඇත. මෙසේ මිය යන පිරිසෙන් මිලියන 04ක පමණ ප්‍රමාණයක් ආසියානු හා ශාන්තිකර කලාපීය රටවල්වලින් වාර්තා වන බැවින්, එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන මෙවර පරිසර දින තේමාව "වායු දූෂණය" ලෙස නම් කර ඇත.

05. වායු දූෂණය ස්වභාවිකවම වෘක්ෂලතා මඟින් අවම කරන අතර රට තුළ සුවදායී පාරිසරික තත්ත්වයක් ඇති කිරීමෙහිලා ප්‍රශස්ත වන ආවරණයන් පවත්වා ගෙන යාම බෙහෙවින්ම උපකාරී වේ. එබැවින්, මෙවර පරිසර දිනය ශ්‍රී ලංකාව සමරනු ලබන්නේ වන ගහණය ඉහළ නැංවීම සහ තිරසර වන කළමනාකරණයක් තුළින් වායු දූෂණය අවම කිරීම අරමුණු කර ගනු ලැබූ, **"තිරසර වන කළමනාකරණයක් තුළින් වායු දූෂණය අවම කිරීම"** යන තේමාව යටතේ ය.

06. "ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන" යන මැයෙන් 2016 වසරේ අප්‍රේල් 28 වන දින අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද විශේෂ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව ජගත් පරිසර දින උත්සවයට සමගාමීව **"ජාතික පරිසර සතියක්"** ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව, මෙම වසරේ **මැයි මස 30 සිට ජූනි 05** දක්වා වන සතිය "ජාතික පරිසර සතිය" ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර එම දිනයන් ද විශේෂිත තේමා යටතේ පහත පරිදි නම් කර ඇත.

| | |
|---|---|
| මැයි 30 | පරිසරය පවිත්‍ර කිරීම හා පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ දිනය |
| මැයි 31 | වායු දූෂණය හා අහිතකර බලපෑම් අවම කිරීමේ දිනය |
| ජූනි 01 | රුක් රෝපණ දිනය |
| ජූනි 02 | ජලය හා ජල මූලාශ්‍ර සංරක්ෂණ දිනය |
| ජූනි 03 | ජෛව විවිධත්වය සංරක්ෂණ දිනය |
| ජූනි 04 | තිරසර ඉඩම් කළමනාකරණ දිනය |
| ජූනි 05 | ජගත් පරිසර දිනය |

07. ඒ අනුව, සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන ප්‍රධානීන් විසින් තම කාර්ය මණ්ඩලය ද, විදුහල්පතිවරුන් විසින් තම විදුහලේ ගුරුභවතුන් සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද ජගත් පරිසර දිනයේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම, කාර්යාල හා පාසල් පරිශ්‍ර පවිත්‍ර කිරීමේ ශ්‍රමදාන පැවැත්වීම, පසුගිය පරිසර දිනයන්ට සමගාමීව ආරම්භ කරන ලද කසළ වර්ගීකරණය හා බැහැර කිරීම් කටයුතු විධිමත් පරිදි පවත්වාගෙන යාම ඇතුළු විවිධ පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කළ යුතු වේ.

08. එසේම, දිවයින පුරා පළාත් පාලන ආයතනවල මූලිකත්වයෙන් එම පළාත් පාලන බල ප්‍රදේශ තුළ, පරිසරය පවිත්‍ර කිරීම, කසළ වර්ගීකරණය හා කසළ කළමනාකරණය ක්‍රියාත්මක කර පවත්වා ගෙන යාම ඇතුළු පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කර පවත්වාගෙන යාම මෙන්ම පැළ සිටුවීම, සොබා සෞන්දර්ය ඔප්නැංවීම මෙන්ම ඒ පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම වැනි පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කළ යුතු වේ.

09. තවද, ජාතික පරිසර සතිය තුළදී රාජ්‍ය ආයතන, පාසල්, වැවිලි සමාගම් හා වතු ක්ෂේත්‍රය, රාජ්‍ය නොවන සංවිධාන, , පෞද්ගලික අංශය හා සිවිල් සංවිධානවල මූලිකත්වයෙන් ප්‍රජාවගේ සහභාගීත්වයෙන් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බව අවධාරණය කරනු කැමැත්තෙමි.

i. අප අවට වාතයේ පිරිසිදු බව පවත්වාගෙන යාමෙන් ලැබිය හැකි වාසි, වායු දූෂණය තුළින් ඇතිවිය හැකි අහිතකර තත්ත්වයන් සහ පරිසර සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම
ii. පොදු ප්‍රවාහන භාවිතය දිරිමත් කිරීම හා විදුලි වාහන භාවිතය ප්‍රවර්ධනය
iii. කෘෂි හා නාගරික ඝන අපද්‍රව්‍ය දහනය අවම කිරීම සහ කාබනික පොහොර නිෂ්පාදනය දිරිමත් කිරීම.
iv. බලශක්ති කාර්යක්ෂම උපාංග භාවිතය හා හරිත බලශක්ති භාවිතය ප්‍රවර්ධනය
v. පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සහ පරිසර හිතකාමී ඇසුරුම් ප්‍රවර්ධනය
vi. විධිමත් කසළ කළමනාකරණ ක්‍රමවේදයන් අනුගමනය කිරීම
vii. වන ආවරණය ඉහළ නැංවීම සඳහා ග්‍රාමීය සහ ආයතන මට්ටමින් රුක් රෝපණ ද්‍රව්‍ය සුලභ කිරීම සඳහා පැළ තවාන් ඇති කිරීම
viii. ජලපෝෂක, රක්ෂිත ප්‍රදේශ, ගංඟා ඉවුරු හා තෙත් බිම් ප්‍රදේශ වැනි පරිසර සංවේදී භූමි හඳුනා ගැනීම සහ ඒවා සංරක්ෂණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
ix. හානියට පත් භූමි පුනරුත්ථාපනය, පාංශු සංරක්ෂණය හා තිරසර ඉඩම් කළමනාකරණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
x. ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා කටයුතු කිරීම
xi. හරිත වෙරළ සංකල්පයට අනුව වෙරළ තීරයේ තුරු ආවරණය වැඩිදියුණු කිරීම, වෙරළ කලාප පවිත්‍ර කිරීම හා වෙරළ ඛාදනය වලක්වා ගැනීම සඳහා පියවර ගැනීම.
xii. වෙරළ පරිසර පද්ධති තිරසර කළමනාකරණය හා කඩොලාන සංරක්ෂණයට ක්‍රියාමාර්ග ගැනීම
xiii. ප්‍රදේශයට අනුව හරිත රැකියා හඳුනා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
xiv. වස විස නැති කාබනික ගොවිතැන හා තිරසර ගෙවතු වගා ප්‍රවර්ධනය කිරීම

10. ඒ අනුව, සෑම ආයතනයක් විසින්ම සුදුසු පරිසර සංරක්ෂණ වැඩසටහන් ජාතික පරිසර සතිය තුළදී ඉටුකිරීම සඳහා පූර්ව සැලසුම් සකස් කර දේශපාලන නායකත්වයේ ද සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කිරීම සුදුසු බව වැඩිදුරටත් දන්වමි.

11. ජාතික පරිසර සතිය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්ට ද පිටපතක් සහිතව ජනාධිපති කාර්යාලයේ "පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන" වෙත වාර්තා කළ යුතුය. එසේම, ඉදිරි වර්ෂයන්හිදී ජාතික පරිසර සතිය ක්‍රියාත්මක කිරීම සහතික කරනු වස් එම වැඩසටහන් තම ආයතනවල, දිස්ත්‍රික්කවල හෝ පළාත්වල වාර්ෂික සැලසුම්වලට ඇතුළත් කර ගැනීමට ක්‍රියා කරන මෙන් ද කාරුණිකව දන්වා සිටිමි.

12. පරිසර සංවේදී ප්‍රජාවක් බිහිකිරීම සඳහා ඔබ දක්වන සහයෝගය අතිශයින් අගය කරමි.

උදය ආර්. සෙනෙවිරත්න
ජනාධිපති ලේකම්

පිටපත්

01. අග්‍රාමාත්‍ය ලේකම් - කරු.දැ.ගැ.ස.
02. අමාත්‍ය මණ්ඩල ලේකම් - කරු.දැ.ගැ.ස.